# නිවේදනය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව අයදුම්පත් කැඳවීම.

මුදල් අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරය යටතේ ඇති දෙපාර්තමේන්තුවල පවතින පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු සංඛ්‍යාව

| සේවාව | 1 ශ්‍රේණිය | 11/111 ශ්‍රේණිය |
|---|---|---|
| ශ්‍රී ලංකා පරිපාලන සේවය | 18 | 34 |
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 08 | 16 |
| ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | 05 | 15 |
| ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 01 | - |

මුදල් අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරය යටතේ වන දෙපාර්තමේන්තුවල පුරප්පාඩුව පවතින තනතුරකට අනුයුක්තව සේවය කිරීම සඳහා කැමැත්ත දක්වන නිලධාරීන්, ඇමුණුමේ දක්වා ඇති ආකෘතිය අනුව සකස්කළ අයදුම්පතක්, නිලධාරියාව වර්තමාන සේවා ස්ථානයෙන් අනුප්‍රාප්තිකයෙකු සහිතව / රහිතව නිදහස් කිරීමට කැමති බව දක්වමින් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුව ප්‍රධානියාගේ නිර්දේශය ඇතුලත්ව 2021.09.10 දින හෝ එදිනට පෙර Addlsec@mo.treasury.gov.lk විද්‍යුත් ලිපිනයට යොමුකළ යුතුය.

මෙහිදී රටේ පවතින තත්ත්වය හමුවේ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ අයදුම්පතෙහි දක්වා ඇති පරිදි විද්‍යුත් ලිපිනයට වෙනම විද්‍යුත් ලිපියක් වශයෙන් යොමු කිරීමද ප්‍රමාණවත් වේ.